DOI: 10.31357/fhssphd.2003.00094

# පර්යේෂකයාගේ ප්‍රකාශය

" සිංහල සාහිත්‍ය මූලාශ්‍රයවලින් පිළිබිඹු වන පැරණි සිංහල විවාහ සංස්කෘතිය (අතීතයේ සිට දඹදෙණිය සමයේ අවසානය දක්වා)" නමැති මෙම පර්යේෂණ නිබන්ධය, උපදේශකවරයාණන් වූ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ උපදේශකත්වය යටතේ මා විසින් ස්වාධීන ව සම්පාදනය කරන ලද බව මම මෙයින් සහතික කරමි. මෙම පර්යේෂණ නිබන්ධය හෝ මින් කොටසක් හෝ කිසිදු විශ්වවිද්‍යාලයක උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ වෙනත් අධ්‍යයන කාර්යයක් සඳහා ඉදිරිපත් කොට නොමැති බව ද සහතික කරමි.

ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ

2003.12. 18

# උපදේශකවරයාගේ ප්‍රකාශය

" සිංහල සාහිත්‍ය මූලාශ්‍රයවලින් පිළිබිඹු වන පැරණි සිංහල විවාහ සංස්කෘතිය (අතීතයේ සිට දඹදෙණි සමයේ අවසානය දක්වා) " නමැති මෙම පර්යේෂණ නිබන්ධය මාගේ උපදේශකත්වය යටතේ ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ මහතා විසින් සම්පාදනය කරන ලද බව මෙයින් සහතික කරමි.

මහාචාර්ය තිස්ස කාරියවසම්

2003. 12. 18
සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

DEC 2003
12 MAY 2005

සිංහල සාහිත්‍ය මූලාශ්‍රයවලින්
පිළිබිඹු වන

# පැරණි සිංහල විවාහ සංස්කෘතිය

(අතීතයේ සිට දඹදෙණි සමයේ අවසානය දක්වා)

ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
සිංහල විෂය පිළිබඳ දර්ශනසූරි උපාධිය
සඳහා මෙම පර්යේෂණ නිබන්ධය ඉදිරිපත් කරන ලදී.

2003

# පටුන


පිටුව

I. ප්‍රවේශය 1

01. හැඳින්වීම : මූලාශ්‍රයයෝ 2

II. ස්ත්‍රී පුරුෂයන් සහ විවාහාපේක්ෂිත සමය 21

01. මනුෂ්‍යයන් සහ ඔවුන්ගේ ස්වභාවය 22

02. ස්ත්‍රීන් සහ ස්ත්‍රී ලක්ෂණ 28

03. පුරුෂයන් සහ පුරුෂ ලක්ෂණ 43

04. තාරුණ්‍යය සහ විවාහ වන කලවයස 49

05. තාරුණ්‍යයේ ක්‍රියාකාරකම් සහ විලාසිතා 59

06. අනංග සංකල්පය සහ ප්‍රේමවන්තයෝ 77

III. විවාහය 86

01. ඇවැස්ස ඥාතිත්වය 87

02. විවාහයට බලපෑ කුලය 93

03. මනමාලියන් සහ මනමාලයෝ 105

04. විවාහ විධි 119

05. විවාහ චාරිත්‍ර 128

06. දායාදය 144

IV. පවුල 149

01. අඹුසැමි සබඳතාව 150

02. සංසර්ගය 173

03. ගර්භිණී භාවය සහ දරු ප්‍රසූතිය 203

04. දූ දරුවෝ 228

V. ගෘහස්ථ ජීවිතය 255

01. දෙ මවුපියෝ 256

02. නෑදෑයන් සහ මිත්‍රයෝ 262

03. පිරිවර සහ දාසයෝ 272

04. නිවාස - ඇඳුම් පැලඳුම් - කෑම් බීම් 285

05. පියාගේ ප්‍රධානත්වය සහ දේපළ උරුමය 316

VI. අසංයත චර්යා 327

01. ඥාති විවාහ සහ වෙනත් විවාහ 328

02. අසද් ස්ත්‍රීහු, ස්ත්‍රී මායම් සහ අයථා සබඳතා 334

03. අනාචාරී පුරුෂයන් සහ ස්ත්‍රී ලෝලය 352

04. අයථා සංසර්ගය 361

VII. ආනුෂංගික කරුණු 365

01. වැන්දඹුවෝ 366

02. විරහී ස්ත්‍රීන් සහ පුරුෂයෝ 370

03. වෙශ්‍යාවන් සහ නාටිකාවෝ 374

04. ලිංගිකත්වය සහ යති සමාජය 382

VIII. නිගමනය 392

* ආශ්‍රිත පොත් 397

* උපග්‍රන්ථය 408

i. මාර්ගඵල ලද ගිහියෝ 409

ii. ආමන්ත්‍රණ පද 413

iii. ඥාති සම්බන්ධතා රටාව 419

11. ඉන්දියාවේ ඛාජුරාවෝහි ගල් කැටයමක්

ආලිංගනය 186

12. ඉන්දියාවේ ඛාජුරාවෝහි ගල් කැටයමක්

සංසර්ගය 194

13. ඉන්දියාවේ පතාරිහි ගල් කැටයමක්

දරු ප්‍රසූතිය 225

14. සීගිරි කුරුටු ගීයක්

15. වල්ලිපුරම් රන්පත් ලිපිය

අධ්‍යාපනය - අක්ෂර කලාව 246

16. අනුරාධපුර ජේතවනයේ ගල් කැටයමක්

පිරිවර සහ දාසයෝ 279

17. සීගිරි චිත්‍ර යුගලක්

ඇඳුම් පැළඳුම් 301

18. ඉසුරුමුණියේ ගල් කැටයමක්

පවුල - පියාගේ ප්‍රධානත්වය 324

19. ඉන්දියාවේ සාංචිහි ගල් කැටයමක්

ස්ත්‍රී ලීලා 343

20. ඉන්දියාවේ චම්පාහි ගල් කැටයමක්

නාටිකාවෝ 380

# සංකේත අක්ෂර

(නිතර සඳහන් වන කෘතිවල කෙටි යෙදුම්)

| | | |
|---|---|---|
| අදාස. | - | අටදා සන්නය |
| අව. | - | අමාවතුර |
| අසස. | - | අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය |
| අශා. | - | අභිඥාන ශාකුන්තලය (සකුන්තලා) |
| ආස. | - | ආයුර්වේද සමීක්ෂා |
| එසල. | - | එළු සඳැස් ලකුණ |
| උපා. | - | උදාන පාලිය |
| ඍස. | - | ඍතු සංහාරය |
| කවි. | - | කර්ම විභාගය |
| කසි. | - | කව්සිළුමිණ |
| කාසූ. | - | කාමසූත්‍රය |
| කැස. | - | කැලි සන්නය |
| තිකු. | - | තිරුක්කුරළ් (සිරි ගීය) |
| තේගී. | - | තේරී ගී |
| ථෙගාභා. | - | ථෙරිගාථා භාවගීතය |
| දඅකසි. | - | දඹදෙණි අස්න සහ කඳවුරු සිරිත |
| දස. | - | දහම්සරණ |
| දඅගැ. | - | ධම්පියා අටුවා ගැටපදය |
| ධප්‍ර. | - | ධර්මප්‍රදීපිකාව (අමරමෝලි හිමි - සංස්.) |
| ධප්‍රදී. | - | ධර්මප්‍රදීපිකාව (විමලකීර්ති හිමි සහ සුමංගල හිමි - සංස්.) |
| ජාඅගැ. | - | ජාතක අටුවා ගැටපදය |

| | | |
|---|---|---|
| ජාගාස. | - | ජාතක ගාථා සන්නය |
| නීති. | - | නීති නිඝණ්ඩුව |
| පත. | - | පංචතන්ත්‍රය |
| පපජා. | - | පන්සියපනස් ජාතක පොත |
| පුසිස්ඇ. | - | පුරාණ සිංහල ස්ත්‍රීන්ගේ ඇඳුම |
| පූව. | - | පූජාවලිය |
| ප්‍රාසිශකෝ. | - | ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය |
| බුස. | - | බුත්සරණ |
| භාධසිසි. | - | භාරතීය ධර්මශාස්ත්‍ර සහ සිංහල සිරිත් විරිත් |
| මනු. | - | මනුස්මෘති |
| මබෝවග්‍ර. | - | මහා බෝධිවංශ ග්‍රන්ථිපදය |
| මව. | - | මහාවංශය |
| මලස. | - | මධ්‍යකාලීන ලංකා සමාජය |
| මලසංස්. | - | මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය |
| මසික. | - | මධ්‍යකාලීන සිංහල කලා |
| මුව. | - | මුවදෙව්දාවත |
| යාවස්. | - | යාඥවල්කස්මෘති |
| රරප්‍ර. | - | රතිරත්න ප්‍රදීපිකාව |
| රවා. | - | රසවාහිනී |
| රුමපිම. | - | රුවන්මල සහ පියුම්මල |
| ලබුඉ. | - | ලක්දිව බුදුසමයේ ඉතිහාසය |
| ලස. | - | ලකුණුසර |
| ලසෙ. | - | ලක්දිව සෙල්ලිපි |
| විමාමස. | - | විසුද්ධි මාර්ගය - මහා සන්නය සහිත |
| විමාස. | - | විසුද්ධි මාර්ග සන්නය |
| වෙදාස. | - | වෙසතුරුදා සන්නය |
| සර. | - | සද්ධර්මරත්නාවලිය |
| සල. | - | සද්ධර්මාලංකාරය |

| | | |
|---|---|---|
| සව. | - | සසදාවත |
| සවප්‍ර. | - | සහස්සවත්ථුප්‍රකරණය |
| සස. | - | සඟසරණ |
| සික. | - | සිංහල කතිකාවත් (සහ භික්ෂු සමාජය) |
| සිව. | - | සිංහල දීපවංශය |
| සිප්‍රපිසා. | - | සිංහල ප්‍රස්තාව පිරුළු සාහිත්‍යය |
| සිබෝව. | - | සිංහල බෝධිවංශය |
| සිරප. | - | සිරි රහල් පබඳ |
| සිල. | - | සියබස්ලකර |
| සිවසිවි. | - | සිබවළඳ සහ සිබවළඳ විනිස |
| සිවිමා. | - | සිංහල විසුද්ධි මාර්ගය |
| සිස. | - | සිදත් සඟරාව |
| සිසස. | - | සිංහල සමාජ සංවිධානය |
| සිසා. | - | සිංහල සාහිත්‍යය I |
| සිසාග්‍රප්‍ර. | - | සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකා |
| සිසාව. | - | සිංහල සාහිත්‍යවංශය |
| සිං. | - | සිංහලයෝ |
| සීගී. | - | සීගිරි ගී |
| සීගීනි. | - | සීගිරි ගී නිර්මාණ |
| සීව. | - | සීහලවත්ථු |
| ශ්‍රීසුශකෝ. | - | ශ්‍රී සුමංගල ශබ්දකෝෂය |
| **EZ.** | - | Epigraphia Zeylanica |
| **SG.** | - | Sigiri Graffiti |
| **HC.** | - | History of Ceylon |
| **HMCC.** | - | Hindu Manners, Coustoms and Ceremonies |
| **JRAS (CB).** | - | Journal of The Royal Asiatic Society (Ceylon Branch) |

# උපකාරානුස්මෘතිය

පුරාණ සිංහල විවාහ සංස්කෘතිය පිළිබඳ කරුණු හැදෑරීමේ මේ පර්යේෂණ කාර්යය අරඹයා අගනා උපදේශයන් දෙමින් ද මග පෙන්වීම් කරමින් ද මේ සඳහා ධෛර්යය ලබා දුන් මාගේ උපදේශකවරයාණන් වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා වෙත ප්‍රථම කොට මාගේ ප්‍රණාමය පළ කොට සිටිමි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨාධිපති සහ පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලයේ සභාපති මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මහතා සහ සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යායනාංශ ප්‍රධාන මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා වෙත ද මාගේ ගෞරවය ප්‍රකාශ කර සිටිමි.

එසේ ම මහාචාර්ය රත්න විජේතුංග මහතා, මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක මහතා, මහාචාර්ය ඩී. එල්. අබේවර්ධන මහතා, මහාචාර්ය මාලනී ඇඳගම මහත්මිය, මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා ඇතුළු ආචාර්ය භවතුන්ගෙන් ලත් මහත් උපකාර පිළිබඳ ව ද අතිශය කෘතඥ වෙමි.

ශාස්ත්‍රීය පර්යේෂණ කාර්යයන්හි ලා මට මහත් ශක්තියක් ද අගනා ගුරූපදේශයන් ද ලබා දුන් මහාචාර්ය ඒ.වී. සුරවීර මහතාණන් ගැන ගෞරවයෙන් යුතු ව සඳහන් කරමි. නො මසුරු ව අගනා පොතපත ලබා දීමෙන් ද දිරි ගැන්වීමෙන් ද උපකාරී වූ අධිනීතිඥ වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතාණන් ගැන ද වෙසෙසින් සටහන් කරමි.

මාගේ සාහිත්‍ය සහ ශාස්ත්‍රීමය කාර්යයන්හි දී ද මෙහි දී ද මට උපකාරී වූ විද්වතුන් අතුරින් මහාචාර්ය විමල විජයසූරිය (අභාවප්‍රාප්ත) මහතා, මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි, මහාචාර්ය මැන්දිස් රෝහණධීර මහතා, මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා, මහාචාර්ය විනී විතාරණ මහතා, කේ. ජයතිලක මහතා, දයා රෝහණ අතුකෝරාල මහතා ආදීන් ගැන කෘතඥතාවෙන් සිහිපත් කරමි.

මේ පර්යේෂණ කාර්යයෙහි දී ශාස්ත්‍රීය උපකාරයන්ගෙන් ද දුලබ පොතපත සපයා දීමෙන් ද පාලි සහ සංස්කෘත පාඨයන්හි බොහෝ දුරවබෝධ තැන් නිරවුල් කර දීමෙන් ද මහත් සේ උදව් වූ සිංහල ශබ්දකෝෂයේ විද්වත් මණ්ඩල කර්තෘ ආචාර්ය පණ්ඩිත කේ.බී.ඒ. එඩ්මන්ඩ් මහතාගෙන් ලද උපකාරය අතිශයින් අගයමි. දුලබ පොතපත ලබා දීමෙන් ද පාලි සහ සංස්කෘත පාඨ නිරවුල් කර දීමෙන් ද උපකාරී වූ වැලිකඩ ශ්‍රී සද්ධර්මරාජික විහාරාධිපති පණ්ඩිත ගලගොඩඅත්තේ සදාණසාර හිමිපාණන් ගැන ද ගෞරව පූර්වක ව සඳහන් කරමි.

නීතිඥ චන්ද්‍රා සිල්වා (අභාවප්‍රාප්ත) මහතා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආචාර්ය ගාමිණී කාරියවසම් මහතා සහ නිශ්ශංක පුෂ්පකුමාර මහතා මට මේ කාර්යයේ දී නො මසුරු ව සහයෝගය දැක්වූවෝ වෙති.

පොතපත සපයා දීමෙන් ද තවත් විවිධාකාරයෙන් ද මධ්‍යම සංස්කෘතික අරමුදලේ මාධ්‍ය උපදේශක විද්‍යාපති සිරිසමන් විජේතුංග, කොළඹ මහජන පුස්තකාලයේ හිටපු ප්‍රධාන පුස්තකාලයාධිපති එම්.ඩී.එච්. ජයවර්ධන, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පිරිස් කළමනාකාර ශාස්ත්‍රපති ඇම්.ඩී. අතුලවංශ, රාජ්‍ය චිත්‍රපට සංස්ථාවේ සංස්කෘතික කාර්යාංශයේ කළමනාකාර විමල් සපුකොටන, රාජගිරිය මහජන පුස්තකාලයේ හිටපු ප්‍රධාන පුස්තකාලයාධිපති ඒ. ඇම්. ගුණපාල, නුගේගොඩ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති සුජීව ප්‍රනාන්දු, කොළඹ මහජන පුස්තකාලයේ ලලිත් දයාකුමාර, රාජගිරිය මහජන පුස්තකාලයේ සත්‍යප්‍රිය විජේසිංහ යන මහතුන්ට ද මහත් සේ ස්තුතිවන්ත වෙමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය, රාජගිරිය මහජන පුස්තකාලය, නුගේගොඩ මහජන පුස්තකාලය මට මේ කාර්යයෙහි දී මහත් උපකාරී විය. එපමණක් නො ව සිංහල ශබ්දකෝෂ පුස්තකාලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තු පුස්තකාලය, කෞතුකාගාර දෙපාර්තමේන්තු පුස්තකාලය, රාජ්‍ය ලේඛනාගාර පුස්තකාලය දුර්ලභ පොතපත සපයාගැන්මට පිහිට විය. මේ සෑම පුස්තකාලයක ම කාර්ය මණ්ඩලයන් වෙත මාගේ ස්තුතිය පිරිනමමි. එසේ ම කේ. මර්වින් පෙරේරා හිතවතාණන්ගේ පොත් එකතුව මේ කාර්යයෙහි දී ද මහත් පිටුබල වූ බැව් සෙනෙහසින් යුතු ව සඳහන් කරමි.

මාගේ ඥාති පුත්‍ර ශාස්ත්‍රවේදී මධුරංග ශ්‍රී අලවත්තගේ මහත් ඕනෑකමින් මේ කාර්යය ගැන සොයා බලා අතහිත දුන් බැව් සඳහන් කළ යුතු ය. මාගේ දයාබර භාර්යාව සුන්ද්‍රානී ශ්‍රී අලවත්තගේ ද මාගේ පුත්‍රයා සෞන්දර්ය ශ්‍රී අලවත්තගේ ද පරිත්‍යාගශීලී ව මේ කාර්යයට දායක වූහ.

මේ නිබන්ධයෙහි අත් පිටපතෙහි පරිගණක අක්ෂර සංයෝජනය මනා ව සිදු කළ සීතා විජේතුංග මහත්මිය වෙත ද මාගේ මහත් වූ ස්තුතිය පළ කරමි.

සිංහල සාහිත්‍ය මූලාශ්‍රයවලින් පිළිබිඹු වන

# පැරණි සිංහල විවාහ සංස්කෘතිය

ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ

## සාරාංශය

විවාහප්‍රාප්ත වීම යනු දුරාතීතයේ සිට ම මානව වර්ගයාගේ විශේෂිත භාවය සලකුණු කළ ශිෂ්ටාචාරයේ ප්‍රමුඛාංගයක් විය. ස්ත්‍රියගේ රූපශ්‍රීයත් පුරුෂයාගේ පෞරුෂයත් උත්කෘෂ්ට ලෙස ගැනිණි. අභිරූපිකාවෝ පංචකල්‍යාණියෝ ද විශිෂ්ට තැනැත්තෝ මහා පුරුෂයෝ ද වූ හ. ස්ත්‍රියක පරිපූර්ණ යව්වනයෙන් සහ රූපශ්‍රීයෙන් බැබැළුණු සොළොස් හැවිරිදි වයස ඈ විවාහ ප්‍රාප්ත විය යුතු සමය සේ පිළිගැනුණි. පුරුෂයාගේ ප්‍රමුඛභාවය හේතුවෙන් එහි දී ඔහුගේ වයස මඳක් ඉදිරියෙන් තිබිණි. එහෙත් ස්ත්‍රියගේ තත්ත්වය පහත් කොට නො සැලකුණා මෙන් ම ව්‍යවහාරයේ දී පවා ස්ත්‍රීවාචී යෙදුම පළමු ව යෙදුණු බව දැකිය හැකි ය.

විවාහයට බල පෑ ප්‍රබල හිමිකම වූයේ අවැස්ස ඥාතිත්වය යි. එය අභියෝගයට ලක් කළ නො හැකි තරමේ ස්ථාපිත අයිතිවාසිකමක් විය. සමාජ සංස්කෘතියේ කුල ක්‍රමය පවත්වා ගෙන යෑමට එය පාදක විය. ඇවැස්සකම ඇතත් නැතත් කුලය විවාහයට ප්‍රධාන සුදුසුකම සේ ගැනුණු අතර එය වනාහි අබිබවා යා නො හැකි රීතියක් වූයේ ය. විවාහ යෝජනාදියෙන් තොර ව කලත්‍රයා තෝරා ගැන්මේ අවස්ථා තිබූ විටෙක දී වුව කුලයේ ප්‍රමුඛතාව ඉහළින් සිටියේ ය.

විවාහය ලිඛිත ව සිදු නො වුණ ද අතපැන් වත් කොට පර්ෂද් මධ්‍යයේ දී පාවා දීම ලිඛිත විවාහයක් තරමට ම බලගතු විය. දායාද දීම ද චාරිත්‍ර සේ පිළිගැනුණි.

බෙහෙවින් සිදු වී ඇත්තේ දීග විවාහ ප්‍රකාර කැන්දා ගෙන යෑම වුව ද බින්න විවාහ ද

සිදු විණි. විවාපත් වීමෙන් ජීවිතය සම්පූර්ණ වූ සේ සැලකුණු අතර තරුණ වියේ දී විවාපත් නො වූවෝ විරල වූ හ. තරුණියකගේ චරිත ශුද්ධියේ අග්‍රාංගය කන්‍යාභාවය සේ ගැනුණා සේ ම භාර්යාවකගේ පතිව්‍රතාව එසේ ම උතුම් ලෙස සැලකිණි. භාර්යාවගේ සදාචාරශීලී භාවයෙන් ගෘහය සුබස්ථානයක් කෙරිණි.

අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුක්ත වූ සංසර්ගය දෙ දෙනා ම එක සේ තෘප්ත කරලී ය. සංසර්ග පූර්ව ක්‍රියාවන් රැසකින් ඊට ප්‍රවිෂ්ට වුණු අතර එහි කලාත්මක හා ක්‍රීඩාශීලී භාවයක් ද විණි. දරු ගර්භයක් පිහිටීම එහි වැඩීම හා ඒ උදෙසා පිළිපැදිය යුතු ' ගබ පෙරහර ' ආදි වූ ප්‍රායෝගික විධිවිධාන ගැන මෙන් ම මාතෘ කුක්ෂියේ අභ්‍යන්තර තතු හා දරු ප්‍රසූතය සිදු වීම ගැන ද නිසි දැනුමෙන් කටයුතු කෙරිණි. දරුවන් වැඩි සංඛ්‍යාවක් ලැබීම නො සතුටට කරුණක් නො විණි. යව්වනයෙහි දී විවාපත් වීමෙන් වැඩි දරු සංඛ්‍යාවක් සඳහා මනා ශාරීරික සෞඛ්‍යයක් ද සෑහෙන කාල පරාසයක් ද තිබිණි. ස්ත්‍රියකගේ විවාහ ජීවිත කාලයෙහි සෑහෙන ප්‍රමාණයක් වැය වූයේ දරුවන් කුසේ දැරීම හා වැඩීම උදෙසා ය.

බෙහෙවින් එක් ගෘහයක පරම්පරා තුනක් ජීවත් වූ බැවින් සිය දෙ මවුපියන් ද සිය දූ දරුවන් ද සමග අඹු සැමියෝ කල් ගත කළහ. ඉසුරුමත් පවුල්වල දාසාදීන් සිටිය ද සාමාන්‍ය පවුල්වල කුදු මහත් දෑ ඔවුන් විසින් ම සපුරා ගැනිණි. ස්ත්‍රීහු සාමාන්‍යයෙන් රැකියාවන් නො කළ මුත් සිය සැමියන්ගේ කාර්යයන්ට පිටුබල වූවෝ ය. ඔවුන්ගේ ප්‍රධාන කාර්යය වූයේ මනා ව දරුවන් තැනීම සහ ගෘහ පාලනය වේ.

ගෘහභාණ්ඩ වශයෙන් කියැවෙනුයේ හැඳ, පුටු ගැන ය. වෙනත් භාණ්ඩ අල්ප විය. ඇඳුම් විෂයයෙහි ස්ත්‍රී පුරුෂ දෙ පක්ෂය ම යටි කය රෙද්දක් ද අවශ්‍ය විටෙක උඩුකය පෙරවූ රෙද්දක් ද යන චාම් ඇඳුමෙන් යුක්ත වූහ. ප්‍රධාන ආහාරය බත ම වූයෙන් කෑම හැඳින්වූයේ ද බත යනුවෙනි. පිතෘ මූලික පවුල් සංස්ථාවක් වුව ද ස්ත්‍රියට පහළ තැනක් නො ව නිසි තැන හිමි විණි.

පවුල් සංස්ථාවට බාධාකර වූ අසංයත තත්ත්ව පැවතුණ ද එය අල්ප වූයේ ය. වැන්දඹු ස්ත්‍රීහු සමාජයෙහි කොන් කරනු ලැබුවෝ නො වූ හ. දෙ වැනි විවාහ සඳහා ද ඔවුන්ට අවස්ථා තිබිණි.

යව්වනයෙහි විවාපත් ව කායික හා මානසික අවශ්‍යතා නිසි සමයෙහි තෘප්ත වූ බැවින් ද ස්ත්‍රීන්ට ද පුරුෂයන්ට ද දෛනික ජීවිතයෙහි කුදු මහත් කාර්යයන් නිරන්තර ව තිබූ බැවින් ද අනාචාරී ප්‍රවණතාව අවම විණි. ඒ වාතාවරණය යහපත් විවාහ සංස්කෘතියක් උදෙසා පාදක වූයේ ය.